# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණ කාලීන)

## දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2016

## CU 504 - පාසල් මට්ටමේ සැලසුම්කරණය හා කළමනාකරණය

**කාලය පැය තුනයි**

**<u>පළමුවැනි</u> ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න.**

---

01. i. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ පරිපාලන ව්‍යූහය රූප සටහනකින් ඇඳ දක්වන්න.

ii. හෙන්රි ෆෙයෝල් (Henry Fayol) ඉදිරිපත් කරන ලද කළමනාකරුවෙකුගේ ප්‍රධාන කාර්යයන් හතරක් නම් කරන්න.

iii. ශ්‍රී ලංකාවේ පාසල් නගාසිටුවීමේ වැඩසටහනට අදාළව පාසල්වල ක්‍රියාත්මක වන 'පාසල් සංවර්ධන කමිටුවේ' ප්‍රධාන කාර්යයන් හතර (4) ක් ලියන්න.

iv. සැලසුම්කරණයේ ප්‍රධාන පියවරක් වන නියාමනය යන්න පැහැදිලි කරන්න.

v. පාසල් සැලසුම්කරණයේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර මොනවාද?

vi. ගුරු වෘත්තිකභාවයට අදාළ නිර්ණායක හතරක් නම් කරන්න.

vii. විදුහල්පති විසින් අවස්ථාවෝචිතව අනුගමනය කරන කළමනාකරණ ශෛලීන් හතරක් නම් කරන්න.

viii. පන්ති කළමනාකරණයේදී ගුරුවරයෙකු විසින් පාලනය කළ යතු ප්‍රධාන සාධක හතරක් නම් කරන්න.

ix. 'SMART' යන සංකල්පයේ අරුත ලියා දක්වන්න.

x. විවෘත/ජීවී සංවිධානයක් වශයෙන් පාසලක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ හතරක් පෙන්වා දෙන්න. (එකකට ලකුණු 2 බැගින් ලකුණු 20 = 2x10)

02. i. මැක්ස් වෙබර් ඉදිරිපත් කළ නිලබල තන්ත්‍රයේ මූලිකාංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. රජයේ පාසල්වල නිලබල ලක්ෂණවලට වඩා වෘත්තීය ලක්ෂණ ක්‍රියාත්මක වන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. i. F.W.ටේලර් (F.W.Taylor) ගේ අදහස් පාසල් කළමනාකරණයේ සංවර්ධනය සඳහා විදුහල්පතිවරයෙකුට යොදාගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

ii. රජයේ පාසල්වල ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා එල්ටන් මායෝගේ මානුෂීය කළමනාකරණ චින්තනය යොදාගත හැකි ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

04. i. පන්ති කළමනාකරණය පිළිබඳ නිර්වචනයක් ඇසුරින් පන්තිභාර ගුරුවරයාගේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය මනාලෙස කළමනාකරණය කර ගැනීම සඳහා සාර්ථක ගුරුවරයකු විසින් අනුගමනය කළයුතු කටයුතු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. i. සාර්ව හා සූක්ෂම සැලසුම්කරණය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. පාසල් සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් දක්වන්න.

(ලකුණු 05)

iii. පාසල් සැලසුම්කරණ ක්‍රියාවලියේදී විදුහල්පතිවරයෙකු මුහුණදෙන අභියෝග හා ඒවා ජයගැනීමට විසඳුම් යෝජනා කරන්න.

(ලකුණු 10)

06. i. "ගුරු වගවීම" යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. වෘත්තිකයෙකු වශයෙන් ගුරුවරයා අවස්ථාවෝචිත විවිධ භූමිකා, කුසලතා හා ගුණාංග ප්‍රයෝජනයට ගන්නා ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

07. i. පාසල් නගාසිටුවීමේ වැඩසටහන (PSI/SBM) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. මෙම වැඩසටහන යටතේ පාසල්වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය ඉක්මන් වීම නිසා පාසලට ලැබෙන වාසි නම් කරන්න. (ලකුණු 05)

iii. පාසල් නගාසිටුවමේ වැඩසටහන ක්‍රියාත්මක වීමේදී මතුවන ප්‍රබලතා හා දුබලතා විස්තර කරන්න. (ලකුණු 10)

08. i. මින්ට්ස්බර්ග් පෙන්වා දුන් පරිදි පාසල් කළමනාකරණයේදී විදුහල්පතිරුන්ට අවස්ථාවෝචිතව විවිධ භූමිකා යටතේ කටයුතු කිරීමට සිදුවන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. විසි එක්වන ශතවර්ෂයේ අභියෝග ජය ගැනීම සඳහා විදුහල්පති සතු විය යුතු කළමනාකරණ කුසලතා හා ගුණාංග උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

09. i. පාසලක "පූර්ණ විෂයමාලාව" යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශිෂ්‍යයාගේ සමස්ත පෞරුෂ සංවර්ධනය සඳහා පාසලක පූර්ණ විෂයමාලාව කළමනාකරණය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 10)

10. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ද්වි සාධක න්‍යාය (Two factor Theory) ගුරු අභිප්‍රේරණය කිරීමට පාසල් කළමනාකරුවෙකුට වැදගත්වන ආකාරය

ii. ගෙට්සෙල් (Getzel) විසින් ඉදිරිපත් කළ ආයතනික මානය හා පුද්ගල මානය ගුරුවරයාගේ චර්යාව ගොඩ නැංවීමට බලපාන ආකාරය

iii. පීටර් ඩ්‍රකර්ගේ(Peter Drucker) කළමනාකරණ න්‍යායන් පාසලට යොදාගත හැකි ආකාරය

iv. පාසලක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා භාවිත කළ හැකි උපායමාර්ග

v. පාසල් සංවර්ධනයට ප්‍රජා සබඳතා යොදාගත හැකි ආකාරය

(එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20 = 10x2)